# 46 더 신경 쓰도록 하자


## තව හොඳට අවධානය යොමු කරමු

**학습 안내**
අධ්‍යයනය සඳහා වන මාර්ගෝපදේශය

| | |
|---|---|
| ◻ අධ්‍යයන අරමුණු | ප්‍රශ්නයට හේතුව සෙවීම විසඳන ආකාරය පැවසීම |
| ◻ ව්‍යාකරණ භාවිතය සඳහා උපදෙස් | –도록 하다, –게 되다 |
| ◻ වචන භාවිතය සඳහා උපදෙස් | පශු සම්පත් කර්මාන්තය ධීවර කර්මාන්තය |
| ◻ සංස්කෘතික තොරතුරු | පශු සම්පත් කර්මාන්තය හා ධීවර කර්මාන්තයේදී කරන වැඩ |

## 대화 1 සංවාදය 1

Track 142



පහත දැක්වෙන්නේ සුපිකා මහත්මිය හා ගොවිපොළ අයිති වයසක මාමා අතර ඇතිවූ දෙබසකි. මුලින්ම සවන්දී ඉන්පසුව අනුගමනය කරමින් කියවන්න.

**주인 아저씨** 이걸 어쩌지. 수피카, 지난번에 바꾼 사료 말이야. 소한테 잘 안 맞는 것 같아.
මේකට මොකද කරන්නේ. සුපිකා, ගියවර මාරුකළ සත්ව කෑමනේ. ගවයින්ට ගැළපෙන්නේ නැහැ වගේ.

**수피카** 그래요? 농협중앙회에서 좋은 거 나왔다고 해서 바꾸신 거잖아요.
එහෙමද? ජාතික කෘෂිකර්ම සමුපකාර සමිතිය මගින් හොඳ සත්ව ආහාර වර්ගයක් ලැබුණා කියල කියපු නිසා මාරු කලේ.

**주인 아저씨** 추천하길래 믿고 한번 써 봤는데……. 오늘은 배까지 이렇게 불룩해지고 가스도 많이 찬 것 같아.
අනුමත කරපු නිසා එක්වරක් අරගෙන බැලුවත්……. අද මේ වගේ බඩත් පුරවල දාලා ගෑසුත් ගොඩාක් තියනවා වගේ.

**수피카** 그럼, 어떻게 하죠? එහෙනම් මොකද කරන්නේ?

**주인 아저씨** 우선 아무 것도 먹이지 말고 수의사부터 불러야겠어. 그리고 앞으로는 더 신경 쓰도록 하자. 소들이 고생을 많이 한 것 같아, 휴.
මුලින්ම කිසිම දෙයක් කන්න දෙන්නේ නැතුව තියලා පශු වෛද්‍යවරයාව කැඳවන්න ඕනේ. ඉදිරියේදී මීට වඩා අවදානයෙන් අවධානය යොමු කළාටු. ගවයින්ට ගොඩක් අමාරුයි වගේ.

> **맞다** ගැළපෙනවා
> **N이/가 N에/에게(한테) 맞다**
> යම්කිසි දෙයකට ගැළපෙනවා
> · 새로 산 신발이 발에 안 맞아서 다른 신발로 바꿨어요.
> අලුතින් ගත් පාවහන් කකුලට ගැලපෙන්නේ නැති නිසා වෙනත් පාවහන් වලට මාරු කලා.

> **신경(을) 쓰다**
> අවදානය යොමු කරනවා
> · 가: 이반 씨, 감기는 좀 어때요?
> ඉවාන්, මහතා හෙම්බිරිස්සාව අඩුද?
> 나: 많이 나았어요. 신경 써 줘서 고마워요.
> ගොඩක් අඩුයි. අවධානය යොමු කළාට ස්තුතියි.



හොඳින් අසා නැවත කියෙව්වා ද? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 아저씨는 사료를 왜 바꿨어요? මාමා ඇයි සත්ව කෑම මාරු කළේ?
2. 왜 수의사를 부르려고 해요? පශු වෛද්‍යවරයාව කැඳවන්නේ?

정답 1. 농협중앙회에서 추천해서 바꿨어요. 2. 소에게 문제가 생겨서 수의사를 부르려고 해요.



## 어휘 1 වචන මාලාව 1 **축산업** පශු සම්පත් කර්මාන්තය

පහත දැක්වෙන්නේ පශු සම්පත් කර්මාන්තයට සම්බන්ධ විවිධ යෙදුම් වේ. කුමන යෙදුම් තිබේදැයි බලමු.



돼지
ඌරා



소
ගවයා



닭
කුකුළා




양
බැටළුවා



오리
තාරාවා



말
අශ්වයා




토끼
හාවා



양돈
ඌරු කොටුව



양우
ගව ගාල



양계
කුකුල් කොටුව



축사
සත්ව මඩුව




사료/먹이
සත්ව ආහාර



건조
පිදුරු

ඉහත සඳහන් වචන මාලාව දෙස නොබලා ගැටලුව විසඳීමට උත්සාහ කරන්න.

1. 그림에 맞는 표현을 〈보기〉에서 골라 넣으세요.
පින්තූරයට ගැලපෙන ප්‍රකාශය උදාහරණ කොටසින් තෝරා ලියන්න.




**보기**
돼지
닭
소
축사
건초

**정답** 1) 닭 2) 소 3) 축사 4) 돼지 5) 건초

## 문법 1 සංවාදය 1 -도록 하다

G46-1

ක්‍රියා පදයකට සම්බන්ධ කර වෙනත් පුද්ගලයෙකුට යම් ක්‍රියාවක් කිරීමට සැලැස්වීම හෝ වැඩ කිරීමට නියම කරන අවස්ථා වලදී බොහෝ විට භාවිතා වේ. එම විධානයට ප්‍රතිචාර දැක්වීම සඳහාත් මෙම ව්‍යාකරණය යොදා ගත හැකිය.

- 가: 먼저 먼지부터 **닦도록 하세요**. මුලින් දූවිලි වල ඉඳලා පිස දමන්න.
  나: 그럼 창문을 좀 열게요. එහෙනම් ජනේලය ටිකක් අරින්නම්.
- 가: 중요한 시험이니까 열심히 **준비하도록 하세요**. වැදගත් විභාගයක් නිසා මහන්සි වෙලා සූදානම් වෙන්න.
  나: 네, 최선을 **다하도록 할게요**. හොඳයි. මට හැකි උපරිමයෙන් කරන්නම්.



'-도록 하다' අවබෝධ වුනාද එහෙමනම් මෙම යෙදුම යොදා දෙබස සම්පූර්ණ කරන්න.


**2. '-도록 하다'를 사용해서 대화를 완성하세요.** '-도록 하다' යොදා දෙබස සම්පූර්ණ කරන්න.

1) 가: 사장님, 오늘 아침에는 어떤 일을 하면 돼요? ප්‍රධානී තුමා අද උදේ මොනවද කරන්න තියෙන්නේ?
   나: ______________________. [축사를 청소하다 සත්ව ගොවිපොළ පිරිසිදු කරනවා]

2) 가: 건초는 잘 챙겨 두었지요? පිදුරු අරන් තිබ්බාද?
   나: ______________________. [바로 확인하다 දැන්මම පරීක්ෂා කරනවා]

3) 가: 축사에 가서 ______________________. [소 먹이를 주다 ගවයින්ට කෑම දෙනවා]
   나: 네, 창고에 가서 사료 가져올게요. ඔව්, ගබඩාවට ගිහිල්ල සත්ව කෑම අරගෙන එන්නම්.

정답 1) 축사를 청소하도록 하세요 2) 바로 확인하도록 하겠습니다 3) 소 먹이를 주도록 하세요



තව ටිකක් ඉගෙන ගෙන බලමුද? '-도록 하다' භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. 가: 내일 몇 시에 출발해요? හෙට කීයටද පිටත් වෙන්නේ?
   나: 6시에 출발하니까 ____________. හයට පිටත් වෙන නිසා ප්‍රමාද නොවන්න වග බලාගන්න.

2. 가: 부탁한 보고서는 어떻게 됐어요? ඉල්ලපු වාර්තාව ලෑස්තිද?
   나: 지금 하고 있는데 저녁까지 ____________. දැන් කරගෙන යන ගමන් හවස් වෙද්දී ඉවර කරන්නම්.


3. 가: 올해는 담배를 ____________. මේ වසරේදි නම් දුම්වැටි පානය නවත් වන්න.
   나: 네, 꼭 끊을게요. ඔව් ඔව් අනිවාර්යයෙන්ම නවත්වනවා.

4. 가: 작업장이 좀 지저분한데 청소 좀 해 주세요. වැඩපොළ ටිකක් අපිළිවෙල නිසා පිරිසිදු කරන්න.
   나: 네, 이 일만 끝내고 ____________. මේ, වැඩය අවසන් වී පිරිසිදු කරන්නම්.

정답 1. 늦지 않도록 하세요 2. 끝내도록 할게요 3. 끊도록 하세요 4. 청소하도록 할게요

## 대화 2 සංවාදය 2

Track 143



බාත් හා කලීම් වැඩපොළේ වැඩකරමින් සිටියි. දෙදෙනා කුමක් පිළිබඳව කතා කරනවා ඇත්ද? මුලින්ම දෙබස දෙවරක් අසන්න.

**카림** 그물 좀 미리미리 정리해 놓으라니까 또 그냥 이렇게 됐네.
දැල කලින් සූදානම් කරන්න ගිහිල්ල මෙහෙම උනානේ.

**바트** 어디 좀 봐. 몇 번이나 말했는데 또 그런 거야? 카림 형, 이건 실수가 아니야. 이번엔 마문 씨 불러서 단단히 혼을 좀 내.
මොකද වුනේ කියල බලමු. කීප වතාවක්ම කීවත් ආයෙත මෙහෙම වුනාද? කලීම් අයියා, මේක අත් වැරැද්දක් නෙවෙයි. මෙවර මමුන් මහතාට හොඳටම බනින්න.


**카림** 한 번 쓴 그물은 다 엉켜서 다시 쓰기 어려우니까 꼭 풀어 놓으라고 했는데. 이것 때문에 오늘도 작업을 제때 못 하게 됐잖아.
එක වරක් භාවිතා කළ දැලක් ඇකිලිලා භාවිතා කරන්න අපහසු නිසා අනිවාර්යයෙන්ම ලිහා තබන්න කියලා කිවුවා. මේක නිසා අදත් වැඩ කරන්න වෙන්නේ නැහැ.

**바트** 집어등도 새로 안 갈았고, 양망기도 그대로야.
ඇමට දමන දේවල් මාරු කරලත් නැහැ මාළු දැල් අදිනයත් එහෙම්මමයි.

**카림** 안되겠다. 당장 마문 씨 좀 불러다가 얘기를 해야겠어.
මේ විදිහට කරන්න බැහැ. දැන්මම මමුන් මහතාට කතාකර කියන්න ඕනේ.

> **그냥** නිකං
> ① කිසිඳු වෙනසක් සිදුනොවී ඒ ආකාරයෙන්ම පවතිනවිට
> ② කිසිඳු හේතුවක් හෝ තේරුමක් නොමැතිව
>
> · 가: 여기 다 쓴 공구는 제가 정리할까요?
> මෙතන භාවිතා කර අවසන් උපකරණ මම අරන් තියන්නද?
> 나: 그냥 두세요. 이따가 다시 쓸 거예요.
> නිකං තියන්න තව ටිකකින් නැවත භාවිතා කරනවා.
>
> · 가: 케이크는 왜 샀어요? 오늘 누구 생일이에요?
> ඇයි කේක් ගත්තේ අද? කාගේහරි උපන්දිනයක්ද?
> 나: 아니요, 먹고 싶어서 그냥 샀어요.
> නැහැ, කන්න කැමති හින්ද නිකං ගත්තා.

> **당장** දැන්මම
> · 회의에 늦지 않으려면 지금 당장 출발해야 합니다.
> රැස්වීමට ප්‍රමාධ නොවී යාමටනම් දැන්මම පිටත්වෙන්න ඕනේ.



මෙවර කලීම් හා බාත් ලෙස දෙබස නැවත කියවන්න. හොඳින් අසා නැවත කියෙවුවාද ? එසේනම් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 두 사람은 뭘 하고 있어요? දෙදෙනා මොනවද කරන්නේ?
2. 두 사람은 왜 화가 났어요? දෙදෙනාට තරහා යාමට හේතුව කුමක්ද?

정답 1. 그물을 정리하고 있어요. 2. 동료가 일을 제대로 해 놓지 않아서 화가 났어요.

## 어휘 2 වචන මාලාව 2 　어업 ධීවර කර්මාන්තය




ධීවර කර්මාන්තයට සම්බන්ධ කුමන වචන මොනවාදැයි දැන ගනිමුද?



그물
දැල


통발
උගුල


집어등
ඇමට භාවිතාකරන විදුලි බුබුළු


양망기
දැල් අදින යන්ත්‍ර


밧줄
ලණු


쇠사슬
දම්වැල



고리
කොක්ක



닻
නැංගුරම


도르래
කප්පිය


뜰채
ගොටුව


낚시 바늘
බිලී කොකු


부자/부표
බෝයාව


바늘대
දැල් වියන ඉදිකටු


수중 펌프
වතුර යට භාවිතා කළහැකි පොම්ප


수경
පිහිනුම් කණ්නාඩිය




갈퀴
අත් රේක්කය


스티로폼 상자
සෑජුෆෝර්ම් පෙට්ටි



ඉහත ඉගෙන ගත් වචන නැවත මතක් කර ප්‍රශ්නවලට පිළිතුරු සපයා බලමුද?

1. 사진을 보고 알맞은 말을 연결하세요. පින්තූරය දෙස බලා ගැලපෙන වචනය යාකරන්න.

① 
② 
③ 
④ 
⑤ 

㉠ 닻 　㉡ 통발 　㉢ 부표 　㉣ 양망기 　㉤ 집어등

정답 ① ㉡ ② ㉢ ③ ㉤ ④ ㉠ ⑤ ㉣

# 문법 2 සංවාදය 2 -게 되다

G46-2

ක්‍රියා පදයකට සම්බන්ධ කර බාහිරින් පැමිණෙන බලපෑමක් නිසාවෙන් යම් සිදුවීමක් සිදුවීම හෝ යම් දෙයක වෙනස් වීමක් දැක්වීම සඳහා භාවිතා කෙරේ.


- 가: 날씨 때문에 오늘도 작업을 못 **하게 되었어**. කාලගුණය නිසා අදත් වැඩේ කරගන්න බැරිවුනා.
  나: 큰일이다. 내일은 좋아질까? මාර වැඩේ. හෙට හොඳවෙයිද?
- 가: 아상카 씨는 한국 음식을 잘 먹네요. අසංක මහත්තයා කොරියන් කෑම හොඳට කනවනේ.
  나: 처음에는 못 먹었는데 몇 달 지나니까 잘 **먹게 되었어요**.
  මුලින් නම් කන්න බැරුව හිටියට මාස කිහිපයකට පස්සේ හොඳට කන්න පුළුවන් වුනා.

## 비교해 보세요 සංසන්දනය කර බලන්න

### ✔ '-게 되다' හා '-아지다/어지다'

'-게 되다' හා '-아지다/어지다' යන දෙකම වෙනසක් දක්වන නමුත් '-게 되다' යොදන විට වෙනස මගින් ඇතිවූ ප්‍රතිඵලයට ප්‍රමුඛත්වයක් දෙයි. '-아지다/어지다' වෙනස්වන ක්‍රියාවලියට ප්‍රමුඛත්වයක් දෙනවිට යෙදේ. '-게 되다' බහුලව ක්‍රියා පද සමග යෙදෙන අතර '-아지다/어지다' ක්‍රියා විශේෂණ සමග බහුලව යෙදේ.


- 날씨가 **추워졌어요**.
  날씨가 추워서 일을 못 **하게 되었어요**. (O)
- 날씨가 춥게 되었어요. (X)



'-게 되다' අවබෝධ වුනාද? එසේනම් මෙම යෙදුම භාවිතා කර වාක්‍ය සම්පූර්ණ කර බලන්න.

2. 그림을 보고 '-게 되다'를 사용해서 문장을 완성하세요.
   තව ටිකක් ඉගෙන ගෙන බලමුද? '-게 되다' භාවිතාකර වාක්‍ය සම්පූර්ණ කරන්න.

1) 
낚시를 잘 못 했는데 ______________________.
මාළු ඇල්ලීම හොඳට කරන්න බැරිවුනත් නිතරම මාළු අල්ලන්න ගිහිල්ල දැන් හොඳට පුළුවන්.

2) 
날씨가 너무 안 좋아서 ______________________.
කාලගුණය හොඳ නැති නිසා බෝට්ටුවට නගින්න බැරි වුනා.

정답 1) 자주 해서 지금은 잘하게 됐어요 2) 배를 못 타게 됐어요



තව ටිකක් ඉගෙනගෙන බලමුද? '-게 되다' භාවිතාකර වාක්‍ය සම්පූර්ණ කරන්න.


1. 한국에 처음 왔을 때는 한국어를 잘 못했어요. 하지만 지금은 한국 사람과 자주 얘기해서 ______________________.
   කොරියාවට මුලින්ම පැමිණෙන විට කොරියන් භාෂාව හොඳට කතාකරන්න බැහැ. නමුත් දැන් කොරියන් ජාතිකයන් සමග නිතර කතාකරන නිසා හොඳට කතාකරන තත්වයට පත් වුනා.
2. 고향에 살 때는 요리를 못했어요. 하지만 지금은 요리를 자주 해서 ______________________.
   ගමේ ඉන්නා විටනම් කෑම පිසින්න බැහැ. නමුත් දැන් කෑම නිතරම උයන නිසා හොඳට උයන්න පුළුවන්.
3. 우리 회사가 이사를 했어요. 그래서 저도 회사 근처로 ______________________.
   අපේ සමාගම වෙනත් තැනකට අරගෙන යනවා. එමනිසා මමත් සමාගම කිට්ටුවට ගෙවල් මාරු කලා.

정답 1. 잘하게 됐어요 2. 잘하게 됐어요 3. 이사하게 됐어요


## 활동 ක්‍රියාකාරකම්


**문제가 생겼을 때는 어떻게 해결하면 좋을까요? 〈보기〉처럼 말해 보세요.**
ප්‍රශ්නයක් ඇතිවන විට කෙසේ විසඳනවා නම් හොඳද? උදාහරණයේ දැක්වෙන අන්දමට කතා කරන්න.

**보기** උදාහරණය




그물이 엉키다, 그물을 풀다
දැල අවුල් වෙනවා,
දැල ලිහනවා





1) 


돼지가 먹이를 기다리다, 사료를 주다
ඌරන් කෑම දෙනතුරු බලා සිටිනවා,
සත්වයින්ට කෑම දෙනවා




2) 

축사가 더럽다, 분뇨를 치우다
සත්ව මඩුව අපිරිසිදුයි, ගොම ඉවත් කරන්න



3) 

양망기가 고장나다, 수리하다
දැල් අදින යන්ත්‍රය කැඩෙනවා,
අලුත්වැඩියා කරනවා



**정답** 1) 돼지가 먹이를 기다리니까 사료를 주도록 하세요.
2) 축사가 더러우니까 분뇨를 치우도록 하세요.
3) 양망기가 고장이 났으니까 수리하도록 하세요.

# 정보 තොරතුරු

## 축산업과 어업 현장의 직업
පශු සම්පත් කර්මාන්ත හා ධීවර කර්මාන්ත වල සිදුකරන වැඩ

### 축산업 පශු සම්පත් කර්මාන්ත



사료 배합기 සත්ව ආහාර මිශ්‍ර කරන උපකරණය

사료 배합기에 사료를 투입합니다.
සත්ව ආහාර මිශ්‍ර කරන උපකරණයට සත්ව ආහාර එකතුකරන්න.




스키드로더 පැටවුම් යන්ත්‍රය

스키드로더로 폐기물을 치웁니다.
පැටවුම් යන්ත්‍රයෙන් අපද්‍රව්‍ය ඉවත් කරනවා.



축사 සත්ව මඩුව

축사 지붕을 점검하거나 수리합니다.
සත්ව මඩුවේ වහලය පරීක්ෂාකර බලනවා හෝ අලුත් වැඩියා කරනවා.



분뇨 탱크 සත්ව අපද්‍රව්‍ය ටැංකිය

분뇨 탱크를 조작합니다.
සත්ව අපද්‍රව්‍ය ටැංකිය හසුරවනවා.

### 어업 ධීවර කර්මාන්තය



배를 타고 바다에 나가 물고기를 잡습니다.
බෝට්ටුවෙන් මුහුදට ගොස් මාළු අල්ලනවා.



갯벌에서 조개나 낙지, 굴 등을 캡니다.
මඩ සහිත බිම්වලින් බෙල්ලන් බුවල්ලන් සිප්පි වැනිදේ හාරා එලියට ගන්නවා.



양식장에서 물고기를 길러서 팝니다.
මාළු කොටු වල මාළුන් ඇතිකර විකුනනවා.



염전을 만들어 소금을 생산합니다.
ලුණු ලියදි වලින් ලුණු සාදනවා.

# EPS-TOPIK 듣기 ශ්‍රවණය EPS-TOPIK

අංක එක සහ දෙක වාක්‍යයට සවන් දී ගැළපෙන පින්තූර තෝරන ප්‍රශ්නය වේx හොඳින. අසා ගැලපෙන පින්තතූරය තෝරන්න.

[1~2] 그림을 보고 알맞은 것을 고르십시오.
පින්තූරයට ගැලපෙන යෙදුම තෝරන්න.

Track 144

1.  ① ② ③ ④

2.  ① ② ③ ④

අංක 3 හා 4 ප්‍රශ්නයට සවන්දී ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. අංක 5 කතාවට සවන්දී ප්‍රශ්නයට ගැලපෙන පිළිතුර තෝරන ප්‍රශ්නය වේ. දෙබසට සවන්දීමට පෙර උදාහරණයේ අන්තර්ගතය.

[3~4] 질문을 듣고 알맞은 대답을 고르십시오. ප්‍රශ්නයට සවන් දී නිවැරදි පිළිතුර තෝරන්න.

3. ① 오리를 기르고 있어요. ② 토끼를 본 적이 있어요.
③ 오리 농장에 가 볼까요? ④ 토끼 먹이를 사러 왔어요.

4. ① 어제 갈았어요. ② 안 갈게 됐어요.
③ 내일 갈 거지요? ④ 빨리 갈도록 할게요.

5. 이야기를 듣고 질문에 알맞은 대답을 고르십시오.
කතාවට සවන්දී ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.

남자는 무엇을 확인하려고 합니까? පිරිමි පුද්ගලයා කුමක් පරික්ෂා කිරීමට සූදානම් වන්නේද?

① 그물 ② 통발 ③ 양망기 ④ 집어등



## 듣기 대본 ගවයන් ඇතිකරනවා

1. ① 여: 소를 길러요. ගවයන් ඇතිකරනවා. ② 여: 양을 길러요. බැටළුවන් ඇතිකරනවා.
   ③ 여: 닭을 길러요. කුකුළන් ඇතිකරනවා. ④ 여: 돼지를 길러요. ඌරන් ඇතිකරනවා.
2. ① 여: 어선을 준비해요. ධීවර බෝට්ටුව සූදානම් කරනවා.
   ② 여: 갈퀴를 준비해요. අත් රේක්කය සූදානම් කරනවා.
   ③ 여: 통발을 준비해요. උගුල් සූදානම් කරනවා.
   ④ 여: 그물을 준비해요. දැල සූදානම් කරනවා.
3. 남: 수피카 씨는 농장에서 어떤 일을 해요? සුපිකා මහත්මිය ගොවිපොළේදී  කරන වැඩ මොනවද?
4. 남: 집어등이 좀 어두운 것 같네요. 갈아야겠어요.
   ඇමට භාවිත කරන විදුලි බුබුළු කළුවරයි වගේ. මාරුකරන්න ඕනේ.
5. 여: 어제 작업할 때 보니까 양망기가 잘 돌아가지 않던데…….
   ඊයේ වැඩ කරනවිට දැක්කේ දැල් අදින යන්ත්‍රය හොඳට වැඩ කලේ නැහැ...... .
   남: 안 그래도 수리 맡겼으니까 곧 고칠 거예요. 그리고 오늘은 멀리 안 나갈 거니까 괜찮아요.
   그물 엉킨 게 있는지만 좀 확인해 봅시다.
   එහෙම නොවුනත් හදන්න කියල දුන්න නිසා හදාවි. ඒ වගේම අද වැඩි ඈතකට යන්නේ නැති නිසා කමක් නැහැ. දැල් පැටලිලා තියනවද කියා පමණක් පරික්ෂා කර බලමු.

정답 1. ① 2. ④ 3. ① 4. ④ 5. ①

## 확장 연습 වැඩිදුර අභ්‍යාස

L-46

1. 대화를 듣고 질문에 알맞은 것을 고르십시오.
   සංවාදයට හොඳින් සවන්දී ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරන්න.

   여자가 창고에 가는 이유는 무엇입니까? කාන්තාව ගබඩාවට යන හේතුව කුමක්ද?

   ① 사료를 챙겨 오려고 ② 창고를 치워 놓으려고
   ③ 분뇨를 처리해 두려고 ④ 건초의 상태를 알아보려고

## 확장 연습 듣기 대본 වැඩිදුර අභ්‍යාස ශ්‍රවණ පිටපත

1. 남: 리리 씨, 어제 축사 청소하고 퇴근했지요?
   ලිලී මහත්මිය, ඊයේ වැඩ නිම කළේ ගව මඩුව පිරිසිදු කරලා ඉවරවෙලා නේද?
   여: 네, 깨끗이 청소하고 분뇨도 다 처리했어요. 오늘은 무슨 일을 하면 돼요?
   ඔව්, පිරිසුදුව අස් පස් කර ගොම පොහොරද අයින් කළා. අද කුමන වැඩයද කළ යුත්තේ?
   남: 우선 소한테 먹이를 주세요. 참, 저번에 들여 온 건초는 잘 말랐는지 모르겠네요.
   පළමුව ගවයන්ට ආහාර දීම කරන්න. ආ, ගියවර ගෙනා පිදුරු හොඳින් වියළුණාද නම් දන්නේ නැහැ.
   여: 얼른 먹이부터 주고 나서 창고에 가서 건초를 확인해 볼게요.
   ඉක්මනට ගවයන්ට ආහාර සපයා දී, ගබඩා වලට ගිහින් පිදුරු පිරික්සන්නම්.


정답 1. ④

## EPS-TOPIK 읽기 කියවීම EPS-TOPIK




අංක 1 සිට අංක 2 පින්තූර බලා නිවැරදි වාක්‍යය තෝරන ප්‍රශ්න වේ. උදාහරණය හොඳින් කියවා පින්තූරයට ගැලපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

[1~2] 다음 그림을 보고 맞는 문장을 고르십시오. පහත පින්තූර බලා ගැළපෙන වාක්‍යය තෝරන්න.

1. 

① 부표예요. ② 어선이에요.
③ 수경이에요. ④ 바늘대예요.

2. 

① 사료를 주도록 하세요. ② 먹이를 버리도록 하세요.
③ 돼지를 기르도록 하세요. ④ 분뇨를 치우도록 하세요.



අංක 3 සිට අංක 4 දක්වා හිස්තැනට යෙදෙන නිවැරදි වචනය තෝරන ප්‍රශ්න වේ. හොඳින් කියවා ගැලපෙන පිළිතුර තෝරන්න.

[3~4] 빈칸에 들어갈 가장 알맞은 단어를 고르십시오. හිස්තැනට යෙදෙන වඩාත් නිවැරදි වචනය තෝරන්න.

3. 이 동네에는 소를 키우는 ______________ 농가가 많아요.
මේ අවට ගමේ හරක් ඇති කරන (හරක් කොටු) ගොවි නිවාස ගොඩක් තිබේ.

① 양돈 ② 양우 ③ 양계 ④ 양망

4. ______________은/는 조개를 캘 때 사용해요. (රේක්කය) සිප්පිකටු හාරන විට භාවිතා කරයි.

① 통발 ② 갈퀴 ③ 부표 ④ 밧줄



පහත දැක්වෙන්නේ ඡේදය කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන ප්‍රශ්න වේ. පෙර ඉගෙනගත් දෑ සිහි කරමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

5. 다음 질문에 답하십시오. මීළඟට ගැටලුවට පිළිතුරු සපයන්න.

축산 농가는 여름이 되면 신경 써야 할 일이 많아집니다. 가축들의 위생을 위해 아침저녁으로 축사 청소도 해야 하고, 사료의 상태도 자주 확인을 해야 합니다. 또한 가축들이 더운 여름을 건강하게 보낼 수 있도록 축사를 시원하게 유지하는 것도 중요합니다.
හරක් ගොවිපලවල් ග්‍රීස්ම ඍතුව ආවම බොහෝ අවධානයෙන් කළ යුතු වැඩ රාශියකි. ගෘහාශ්‍රිත සතුන් උදෙසා සවස ගව පිරිසිදු පිරිසිඳු කොට තබා, සත්ව ආහාරවල තත්වයන්ද හොඳින් පරීක්ෂා කල යුතුයි. තවද ගෘහාශ්‍රිත සතුන්ට ග්‍රීස්මය සෞඛ්‍යමත්ව ගතකල හැකිවන පරිදි ගවමඩු සිසිල්ව තබන එකත් වැදගත් වේ.

축산 농가가 여름에 하는 일이 아닌 것을 고르십시오.
හරක් ගොවිපළවල් වල ග්‍රීස්ම ඍතුවේ කරන වැඩ අතුරින් නොවන එක තෝරන්න.

① 축사 청소를 자주 하는 것 ② 가축의 위생을 점검하는 것
③ 축사를 시원하게 유지하는 것 ④ 먹이 상태를 매일 확인하는 것



정답 1. ① 2. ④ 3. ② 4. ② 5. ②



## 확장 연습 වැඩිදුර අභ්‍යාස

[1~2] 빈칸에 들어갈 가장 알맞은 것을 고르십시오. හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න.

1.

저는 ____________에서 일을 합니다. 아침에 제일 먼저 하는 일은 물고기에게 사료를 주는 일입니다.

මම ගොවිපලක වැඩ කරනවා. උදෑසන සිදු කළ යුතු පළමු වැඩය වන්නේ මාළුන්ට කෑම දෙන එකයි.

① 과수원　　② 공사장
③ 양계장　　④ 양식장

2.

여름에는 가축들에게 더 신경을 ____________. 아침저녁으로 축사 청소도 하고 사료의 상태도 자주 점검하십시오.

ගිම්හානයේ දී ගවයන්ට වැඩි අවධානයක් ලබා දිය යුතු ය. උදේ හා සවස ගව මඩුව පිරිසිදු කර නිතරම ආහාරයේ තත්වය පරීක්ෂා කරන්න.

① 꺼 봤습니다　　② 꺼야 합니다
③ 써 봤습니다　　④ 써야 합니다

3. 다음 글을 읽고 무엇에 대한 글인지 고르십시오.

පහත ඇති ඡේදය කියවා කුමක් සම්බන්ධව සඳහන් වී ඇත්ද යන්න තෝරන්න.

바다에서 일할 때 사용하는 도구는 여러 가지가 있습니다. 물고기를 잡을 때 쓰는 그물, 야간작업을 할 때 필요한 집어등, 그물을 끌어 올리는 양망기 등이 있습니다.

මුහුදේ වැඩ කරන විට භාවිතා කරන බොහෝ උපකරණ තිබේ. මත්ස්‍යන් අල්ලා ගැනීමේදී භාවිතා කරන දැල, රාත්‍රී වැඩ සඳහා අවශ්‍ය වන විදුලි පහන, මාළු ඇල්ලීමේදී භාවිතා කරන දැල උඩට ඇද ගන්න භාවිතා කරන යන්ත්‍රය යන දෑ තිබේ.

① 농업 도구　　② 건설업 도구
③ 어업 도구　　④ 축산업 도구

정답 1. ④ 2. ④ 3. ③

## 발음 උච්චාරණය P-23

**හොඳින් සවන් දී පුනරුච්චාරණය කරන්න.**

'වාතය පිට කිරීමේදී බාධාවකට ලක් වී නැගෙන ශබ්ද' දෙකක් එක ළඟ යෙදෙන විට පිටුපසින් තිබෙන ශබ්දය, උගුරට බර දී කරන ශබ්දයක් හෙවත් ද්විත්ව ව්‍යඤ්ජන ශබ්දයක් බවට පත් වේ.

(1) 식당, 속담, 꽃집　　(2) 답장, 옆집, 국수, 꽃가게
(3) 교실에 책상이 있어요.　　(4) 메일에 답장이 없어요.